# දහම් ගුරු ප්‍රථම විභාගය - 2019

## I පත්‍රය

## ප්‍රශ්න හා පිළිතුරු

---

**පළමුවන ප්‍රශ්නයට හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න**

i. ශුද්ධ වූ දේශයට පොරොන්දු දේශයැයි නම් කළේ කුමන හේතුවක් නිසා ද?

- ♦ දෙවියන් වහන්සේ ආබ්‍රහම්ගේ පරම්පරාවට දීමට පොරොන්දු වූ දේශය නිසා

ii. ජුදෙව් ජනතාවගේ සියලු ම අධිකරණ බලතල පැවරී තිබුණේ කුමන සභාවට ද?.

- ♦ සැන්හෙඩ්‍රින් සභාවට

iii. දේව මාළිගාව කැප කිරීමේ මංගල්‍යය පසුකාලයේ දී හැඳින්වූයේ කුමන නමකින් ද?

- ♦ ආලෝකයේ මංගල්‍යය

iv. හෙබ්‍රෙව් බෙදීම අනුව පුරාණ ගිවිසුමේ පොත් බෙදා ඇති ප්‍රධාන කොටස් **තුන** කුමක් ද?

- ♦ නීති පොත් (ටෝරා)
- ♦ දිවැසි පොත් (නබීඊම්)
- ♦ ලියවිලි

v. දෙවියන් වහන්සේගේ ප්‍රඥාව ඇති තැනැත්තාට සතුට ලැබෙන බව සඳහන් වන්නේ ශුද්ධ වූ බයිබලයේ කුමන ග්‍රන්ථයේ ද?

- ♦ හිතෝපදේශය

vi. මෙසියස් තුමා පිළිබඳ පළමු දිවැස් වැකිය ඇත්තේ කුමන දිවැසිවරයාගේ පොතේ ද?

- ♦ යෙසායාගේ පොතේ

vii. 13 වන ලියෝ පාප්තුමා විසින් ශුද්ධ වූ බයිබලයේ සත්‍යයතාවයන් ප්‍රකාශ කරමින් නිකුත් කළ ලේඛනය කුමක් ද?

- ♦ ප්‍රොවිඩෙන්ටිසිමියුස් ඩේවුස් (PROVINDENTISSIMUS DEUS)

viii. දේව රාජ්‍යයේ සුවිශේෂය ලෙස හඳුන්වන්නේ කුමන සුවිශේෂය ද?

- ♦ ශුද්ධ වූ මතෙව් සුබාරංචිය

ix. දිව්‍ය පූජාවේ දී පවත්වන දේශනයේ පරමාර්ථයන් **දෙකක්** ලියන්න.

- ♦ සියලු විශ්වාසිකයනට ආත්මික පෝෂණය ලබාදීමට.
- ♦ එදා ක්‍රිස්තුන් වහන්සේ ජනතාවට දේශනා කළාක් මෙන් සුවිශේෂ පණිවුඩය විශ්වාසිකයනට පැහැදිලි කිරීමට.

- රැස්ව සිටින දේව ජනතාවට දෙවියන් වහන්සේ තමන් වහන්සේගේ වචනය හා ක්‍රියා මගින් ඔවුන් තුළ දිගටම ක්‍රියාකාරී වන අන්දම පෙන්වාදීම.

x. දිව්‍ය පූජාවේ, දිව්‍ය සත්ප්‍රසාදීය පිළිවෙතේ ප්‍රධාන කොටස් **හතර** මොනවා ද?

- පඬුරු සුදානම් කිරීමේ පිලිවෙත
- ස්තෝත්‍ර යාගික යැදුම.
- පූප කැඩීම
- දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ දානය කිරීම.

xi. දිව්‍ය සත්ප්‍රසාදය ලබාගැනීමෙන් පසු අප 'ආමෙන්'යයි කියා උච්චාරණය කරමු. මෙමගින් තහවුරු කරන්නේ කුමක් ද?

- ක්‍රිස්තුන් වහන්සේ ව හඳුනා ගැනිමෙන් අපගේ සහෝදර සහෝදරියන් තුළ ක්‍රිස්තුන් වහන්සේව හඳුනාගැනීමේ වැදගත්කමට හා වගකීමට එකඟවීම.

xii. ජනවන්දනාවේ ප්‍රධාන අංගයන් මොනවා ද?

- දිව්‍ය පූජාව
- දේව ප්‍රසාද නිධාන
- සභාවේ නිල යාච්ඤා හෙවත් දේව ස්තෝත්‍ර ගායනා

xiii. ජනවන්දනාවේ දෙවන වසර සඳහා භාවිතා කරන්නේ කුමන සුවිශේෂය ද?

- මාර්ක් සුවිශේෂය

xiv. ආගමන සමයේ දෙසැම්බර් 17-24 කාලය තුළ අප විසින් සිහිපත් කරන්නේ කුමන සිද්ධියක් ද?

- ස්වාමීන් වහන්සේගේ පළමු පැමිණීම හෙවත් ඓතිහාසික පැමිණීම.

xv. මුල් කිතුනු සභාව ශුද්ධ වූ සතියේ ඉටුකළ වැදගත් කාර්යයන් **දෙකක්** ලියන්න.

- නවකයන් ප්‍රසාද ස්නාපනය සඳහා සුදානම් කිරීම.
- ප්‍රසිද්ධ ලෙස මනස්ථාපනය සඳහා පව්කරුවන් කැඳවීම.
- දේව වචනය, ස්වාමිවාක් ආරාධනාව පිළිබඳ දැනුමක් එම ආධුනිකයනට ලබාදීම.

xvi. පාස්කු සමය තුළ අප සමරණ ප්‍රධාන මංගල්‍යය **දෙකක් ලියන්න**.

- සමිඳාණන්ගේ උත්ථාන මංගල්‍යය
- සමිඳාණන්ගේ ස්වර්ගාරෝහණ මංගල්‍යය
- ශුද්ධාත්ම ආගමන මංගල්‍යය

xvii. ශුද්ධ වූ බයිබලයේ ''ගීතාවලිය'' යාච්ඤාව සඳහා වැදගත්වීමට හේතු **දෙකක්** ලියන්න.

- ගීතාවලිය පොත පෞද්ගලික යාච්ඤාවටත්, සාංඝික යාච්ඤාවටත් භාවිතා කළ හැක.
- කිතුනු සභාව තම නිල යාච්ඤා සඳහා ගීතාවලිය භාවිතා කරයි.
- කිතුනු යාච්ඤාව තිබිය යුතු ගුණාංග ගීතාවලියේ ගීතවල ඇත.

xviii. දෙව්මවු ආත්මශරීර පිටින් ස්වර්ගයට ඔසවනු ලැබීම සිහිපත් කරන්නේ කුමන ජපමාල අබිරහස් තුළින් ද?

- ♦ මෝක්ෂ අභිරහස් තුළින්

xix. ත්‍රිත්ව ස්තෝත්‍ර යාච්ඤාව වැදගත්වීමට හේතු **දෙකක්** ලියන්න.

- ♦ මෙම යාච්ඤාව තුළින් ත්‍රිත්වයේ අභිරහස ප්‍රකාශ කිරීම.
- ♦ ත්‍රිත්වික දෙවිඳුනට ප්‍රශංසා කිරීම.
- ♦ අපගේ ක්‍රිස්තු ජීවිතයේ පදනම ශුද්ධ වූ ත්‍රිත්වය වේ.

xx. ආලෝකයේ අභිරහස් ශු. ජපමාලයට එක් කළ පාප්තුමා කවුද?

- ♦ දෙවන ජුවාම් පාවුලු පාප්තුමා

2. i ශුද්ධ වූ ජපමාලය උච්චාරණය අර්ථාන්විත භක්ති අභ්‍යාසයකි. හේතු **පහක්** ලියන්න.

- ♦ ජේසුස් වහන්සේ හා දේව මාතාවන්ගේ ජීවිතයේ ප්‍රධාන සිදුවීම් ගැලවීමේ අභිරහසට සම්බන්ධවන අයුරින් ජපමාල අභිරහස් ගොඩනගා ඇත.
- ♦ ආනන්ද, වික්ෂෝප, මෝක්ෂ, ආලෝකයේ අභිරහස් යනුවෙන් අභිරහස් හතරක් ඇත.
- ♦ ජපමාල උච්චාරණය ගැඹුරු යාච්ඤාවකි. ගැඹුරු මෙනෙහි කිරීමකි.
- ♦ මැයි හා ඔක්තෝබර් මාසවල ජපමාල භක්තියට විශේෂ ස්ථානයක් දී ඇත.
- ♦ ජපමාලයේ අභිරහස් නව ගිවිසුම හා බැඳී පවතී.
- ♦ පවුල් යාච්ඤාව තුළ ජපමාලය උතුම්ම යාච්ඤාවයි. (6 වැනි පාවුලු පාප්තුමා)
- ♦ දෙව්මව් විවිධ ස්ථානවල දර්ශනය වී ප්‍රකාශ කළේ ද ජපමාලය උච්චාරණය කරන ලෙස ය.

ii ''යාච්ඤාව තුළින් කිතුනු දිවිය සවිමත් වේ''. මෙය හත්වන ශ්‍රේණියේ සිසුනට ඔබ පැහැදිලි කරන්නේ කෙසේ ද. (වචන 100කින් පමණ)

- ♦ යාච්ඤාව තුළින් දෙවිඳුන් පැසසීම, තුති පිදීම, සමාව ඉල්ලීම, අවශ්‍යය දෑ ලබා ගැනීම, අන් අය වෙනුවෙන් මැදහත්වීම.
- ♦ දෙවිඳුන් හමුවී තමන්ව හඳුනා ගැනීම හා ගැඹුරු සබැඳියාවකට පැමිණීම.
- ♦ යාච්ඤාව තුළ සිතුවිලි යහපත් වී මනස නිරවුල් වේ. දෙවිඳුන් තුළ දිවි ගෙවීමට යාච්ඤාව ඉමහත් ලෙස ඉවහල් වේ.
- ♦ යාච්ඤා කිරීම දෙවියන් වහන්සේ හා මිනිසා අතර පවතින ආදරයේ හා නොමැකෙන විශ්වාසයේ සංවාදය යි.
- ♦ ආධ්‍යාත්මිකත්වය ගොඩනැගීමට යාච්ඤාව ආධාර වේ.

3. i ශුද්ධ වූ පාවුලු තුමා නව ගිවිසුම තුළ අද්විතීය පුද්ගලයෙකු බවට නිදසුන් **පහක්** දෙන්න.*)*

- ♦ මුල දී සභාවට පීඩා කළ අයෙක් වූවත් පසුව සිත් හැරී කිතු දහම වෙනුවෙන් ප්‍රබල ලෙස සාක්ෂි දැරීම.
- ♦ අන්‍යජාතින්ට සුබාරංචිය ගෙන යෑමේ පුරෝගාමියා වීම.
- ♦ විවිධ සන්දේශ ලිවීම (සංදේශ 13)

- ජෙරුසලෙම් මන්ත්‍රණ සභාවේ දී නායකත්වය ගැනීම.
- දක්ෂ දේශනාවාදියෙක් වීම.
- ආසියාව තුළ කිතු දහම ගෙනයාමට මුල්වීම.
- ඔහුගේ ගැඹුරු දේව විශ්වාසය අන් අයට ආදර්ශයක් වීම.

ii දහම්ගුරු සේවාවේ යෙදෙන අයහට ශු. පාවුලු තුමාගේ චරිතයෙන් උගතහැකි මාර්ගෝපදේශයන් **පහක්** විස්තර කරන්න.

- නායකත්වය
- ගැඹුරු දේව විශ්වාසය
- කැපවීම, පරිත්‍යාගිශීලි වීම
- ගැඹුරු දේව විශ්වාසය
- දුකසැප සතුටින් විඳ දරා ගැනීම.
- අවංකත්වය
- බැහැපත්කම, ඉවසීම, දයාකරුණාව

4. i දෙවි මිනිස් සබඳතාවය තහවුරු කරන ප්‍රේමයේ උත්තරිතර සංකේතය දිව්‍ය පූජාව ය. මෙය කරුණු **පහකින්** දක්වන්න.

- දිව්‍ය පූජාව ජනවන්දනාවේ ප්‍රධානතම උත්සවයයි. (පාස්කු අභිරහස නැවත සිහි කිරීමයි)
- පිය දෙවිඳුන්ගේ උත්තරීතර ප්‍රේමය දිව්‍ය යාගය වේ.
- මිනිසා හා දෙවිඳුන් අතරත්, මිනිසා හා මිනිසා අතරත් ප්‍රේමයෙන් එකට එක්වන්නේ දිව්‍ය යාගය තුළිනි.
- දිව්‍ය පූජාවට සහභාගිවීමෙන් කිතුනුවා තවත් ක්‍රිස්තුවරයෙක් බවට පත්වීම.
- විශ්ව සබඳතාවය තහවුරු කරන ප්‍රේමයේ උත්තරීතර සංකේතය දිව්‍ය පූජාවයි.
- යාගික භෝජනයත්, තුතිපිදීමේ සැමරුමක්, සහෝදරත්වයේ එක්සත් හමුවක්

ii ජාතික ධර්මෝදේශ ඉරුදිනට සුදුසු විශ්වාසිකයන්ගේ යැදුම් **පහක්** නිර්මාණය කරන්න.

5. i ශු. දේශයේ භූගෝලීය පිහිටීම පිළිබඳ විස්තරයක් කරන්න.

දාන් සිට බෙයර්ෂිබා දක්වා විහිදෙන මේ රටේ දිග සැතපුම් 150 කි. පළල සැතපුම් 50 සිට 60 දක්වා ය. වර්ග ප්‍රමාණය වර්ග සැතපුම් 10,000 කි. වර්තමාන ඉශ්රායෙල් රාජ්‍යයේ වර්ග ප්‍රමාණය වර්ග සැතපුම් 8,000 කි. ගලීල මුහුදේ සිට සැතපුම් 28 ක දුරින් පිහිටා ඇත. ඉශ්රායෙලය පිහිටා ඇත්තේ අප්‍රිකාවත් ආසියාවත් අතර ය. උතුරින් ලෙබනන් හා සිරියාවෙන් ද නැගෙනහිරින් ජෝර්දානයෙන් ද නිරිත දිගින් ඊජිප්තුවේ සිනයි අර්ධද්වීපයෙන් ද මායිම් වී ඇත. තම අසල්වැසි ජාතින් සතුරන් ලෙස සැලකූ ඉශ්රායෙල්වරු මුලින් ම මෙහි පැමිණියේ සංචාරක එඬේරුන් ලෙස ය. ස්ථිර පදිංචියෙන් පසු ඔවුහු ගොවිතැනට හුරු වූහ. ඉශ්රායෙලය සාමාන්‍යයෙන් වියළි රටකි. වසරකට දෙවරක් වැසි ලැබේ. නමුත් දෙවියන් වහන්සේ ඉශ්රායෙලය හැඳින්වූයේ කිරියෙන් පැණියෙන් උතුරන රට ලෙසට ය. රට ප්‍රධාන වශයෙන් කොටස් තුනකට බෙදා ඇත. එනම්, ගලීලය, සමාරිය හා ජුදයාව වශයෙනි.

ii ශු. දේශය පිළිබඳ නිසි අවබෝධයක් ලැබීම ශු. බයිබලය හැදෑරීමේ දී බෙහෙවින් ප්‍රයෝජනවත් වේ. හේතු පහකින් පැහැදිලි කරන්න.

- ශුද්ධ වූ බයිබලය බිහිවූ රට ශු. දේශය වේ.
- දෙවියන් වහන්සේ තෝරාගත් ජනකොට්ඨාසය බිහිවූයේ ශුද්ධ වූ දේශය කරණකොටගෙන ය.
- ශුද්ධ වූ බයිබලයේ උප කර්තෘවරු ඉශ්රාලයේ ජන පිරිස් ය.
- ශුද්ධ වූ ලියවිල්ලේ කර්තෘවරු ඉශ්රාලයේ ජනසමාජයේ ආභාෂය තුළ ලේඛන ගත කර ඇත.
- ශුද්ධ වූ බයිබලය පිළිබඳ නිසි අවබෝධයක් ලබාගැනීමට නම් එම රටේ භූගෝලීය පසුබිම, සමාජීය පසුබිම, ජන ජීවිතයේ පසුබිම ගැන නිසි අවබෝධයක් තිබිය යුතු වේ.

6. i දෙවන වතිකාන කතිකාව 'ජනවන්දනාව' හඳුන්වා දී ඇත්තේ කෙලෙස ද?

- ජනවන්දනාව ක්‍රිස්තුන් වහන්සේ හිස වන්නා වූ ද සියලු ම විශ්වාසකයින් අවයවයන් වන්නා වූ ද, අති ඉන්ද්‍රිය දේහය විසින් දෙවි පියාණන් හට අති උතුම් වන්දනාවක් ප්‍රශංසාවක්, ස්තුතියත් පුදකරන එමගින් මනුෂ්‍යයන් ශුද්ධවත් කරන, දේව ජනතාව ශු. සභාවේ ක්‍රියාකාරිත්වයට යොමු කරන, අග්‍රස්ථානය ද, ශු. සභාවේ මුලු ශක්තිය ගලාඑන්නට සලසන උල්පත වේ.

ii පාස්කු තුන්දින කිතුනු ජනවන්දනාවේ කේන්ද්‍රය වේ මෙය පැහැදිලි කරන්න. (වචන 100 කින් පමණ )

පාස්කු තුන්දින ලෙස ගැනෙනුයේ මහ බ්‍රහස්පතින්දා, මහ සිකුරාදා, ආලේලූයා සෙනසුරාදා යන දින තුනය.

මහ බ්‍රහස්පතින්දා දින දිව්‍ය සත්ප්‍රසාදය ස්ථිර කිරීම හා පූජාත්වරය ස්ථාපිත කළ දිනයන් ය. එදින ප්‍රේමයේ පනත ද පැහැදිලි කෙරිණි. මහ සිකුරාදා ක්‍රිස්තුන් වහන්සේ කුරුසියේ යාගය සිහිපත් කෙරේ. ආලේලූයියා සෙනසුරාදා, පාස්කු ඉරිදා ජේසුස් වහන්සේගේ උත්ථානයේ ප්‍රීතිය සිහිපත් කරයි. උන්වහන්සේ විජයග්‍රාහි උත්ථානය පාස්කු තුන්දින අප සිහියට නගනුයේ දිව්‍ය පූජාව තුළිනි. දිව්‍ය පූජාව කිතුනු දිවියේ කේන්ද්‍රය වේ. දේව ප්‍රසාද නිධාන සඟහා වරප්‍රසාද ගලා එන්නේ දිව්‍ය පූජාව තුළිනි. සෑම ජනවන්දනා මෙහෙයක් ම පාස්කු අභිරහස තුළින් ගලා එයි. පාස්කු අභිරහස ජනවන්දනාවේ කේන්ද්‍රිය වේ.

7. i ශු. බයිබලය ඔබ මීසම තුළ ව්‍යාප්ත කිරීමට සුදුසු යෝජනා '**පහක්** ලියන්න.

- ශු. බයිබලය හෝ එහි කොටස් ජනතාව අතර බෙදා හැරීම.
- ශු. බයිබලය ආශ්‍රිත පොත පත බෙදා හැරීම.
- අසිපා වැනි වැඩසටහන් ආරම්භ කිරීම.
- ශු. බයිබලය ආශ්‍රිත තරඟ සංවිධානය කිරීම. (බයිබල් දැනුම මිනුම)
- බයිබල් මෙහෙයයන් සංවිධානය කිරීම.
- බයිබලය ආශ්‍රිත නාට්‍ය පෙන්වීම.
- චිත්‍ර, පෝස්ටර් ප්‍රදර්ශනය

ii ''දෙව් වදන කිතුනු දිවියට ආලෝකයකි'' යන මාතෘකාව යටතේ බයිබල් මෙහෙයක් සකස් කරන්න.

- දේව වචනය කේන්ද්‍ර කරගෙන බයිබල් මෙහෙය සකස් කරගත යුතුයි.
- පහත දළ සටහනට අනුව හෝ ඊට ආසන්න ක්‍රමයකට බයිබල් මෙහෙයය සකස් කර ගත හැක.

- ■ බයිබල් මෙහෙයයට හැඳින්වීම
- ■ ආරම්භය - ගීතිකාවක් හෝ යැදුමක්
- ■ පසුතැවීම - ගීතිකාවක් හෝ යැදුමක්
- ■ බයිබල් පාඨයක් - පැරණි ගිවිසුමෙන් මෙනෙහි කිරීම
- ■ බයිබල් පාඨයක් - අලුත් ගිවිසුමෙන් මෙනෙහි කිරීම
- ■ විශ්වාසකයන්ගේ ඉල්ලීම්
- ■ ගීතිකාවක්
- ■ අවසාන යැදුම - ස්තුති ගීතිකාවක්

8. පහත සඳහන් මාතෘකාවලින් **තුනක්** තෝරාගෙන කෙටි සටහන් ලියන්න.
(එකකට පේළි **පහක්** පමණ)

**i පැරණි ගිවිසුමේ නීති පොත්**

♦ පැරණි ගිවිසුමේ නීති පොත් ලෙස පිළිගැනුනේ උත්පත්ති පොත, නික්මයාම, ලෙවී ව්‍යවස්ථාව, ගණන් කතාව හා ද්විතීය නීති සංග්‍රහය යන පොත් ය. මේ පොත් පංච පුස්තකය ලෙස ද හැඳින්වේ. මෙම පොත් පහේ ම පොදු තේමාව වනුයේ, ඉශ්රායෙල්වරු දේව ජනතාවක් බවට පත්වීම යි. පංච පුස්තකයේ ප්‍රධාන චරිතය මොසෙස් ය. ප්‍රධානතම සිදුවීම නම්, නික්මයාම හා සීනායි ගිවිසුම වේ.

**ii ශු. ලූක් සුවිශේෂය**

♦ මෙය ලියන ලද්දේ ක්‍රි.ව 80 - 90 පසුව ය. ගවයාගේ ලකුණ මෙහි සංකේතය යි. අන්‍ය ජාතීන් සඳහා ලියන ලද්දකි. පරිච්ඡේද 24 කි. ලූක් තුමාට විශේෂ වූ කරුණු 55 ක් අඩංගු ය. මෙහි තේමාව ජේසුස් වහන්සේගේ දයා කරුණාව හා ගැළවීම සකල ලෝකයාටම පොදු බවයි. ජේසුස් වහන්සේගේ ජීවිත කතාව දෙස ලූක් තුමා බලන්නේ, අන්‍ය ජාතික ඉතිහාසඥයෙකු, වෛද්‍යවරයෙකු හා දක්ෂ ලේඛකයෙකු හැටියට ය. විශේෂ ජුදා සිරිත් විරිත් අන්‍ය ජාතීන්ට මේ සුවිශේෂය මඟින් විග්‍රහ කර පෙන්වා දී තිබේ.

**iii ස්වාමිවාක් ආරාධනාව (පරමණ්ඩල ආරාධනාව)**

♦ ස්වාමීන් වහන්සේ ඉගැන්වූ යාච්ඤාවය. මෙම යාච්ඤාව තුළ යාච්ඤාවක තිබිය යුතු සෑම ගුණාංගයක් ම ඇත. එනම් ප්‍රශංසාව, ස්තුතිය, ජීවිතයට අවශ්‍ය දෑ ඉල්ලීම හා සමාව යැදීම.

**iv සාමාන්‍ය සමය**

♦ මෙය කොටස් දෙකකි. නත්තල් සමයේ අවසාන දින සිට ගුරු අඟහරුවාදා දක්වා එක කොටසක් ද පෙන්තකොස්ත දිනට පසු එන සඳුදා සිට ආගමනයේ පළමු වන ඉරුදිනට පෙර සෙනසුරාදා දක්වා කාලය අනික් කොටසට ද අයත් වේ. සාමාන්‍ය සමයට ඉරුදිනයන් 34 ක් වේ. සාමාන්‍ය සමය තුළ කිතුනු ජනතාව ජේසු සමිඳාණන් තුළ තමන්ට අත්වුණ ගැළවීම මෙනෙහි කරයි. ශුද්ධ වූ ත්‍රිත්වයේ මංගල්‍යය ද සත්ප්‍රසාද මංගල්‍යය ද, ක්‍රිස්තු රජාණන්ගේ මංගල්‍යය ද මේ සමය තුළ පවත්වයි.

**v තුන්වන දේව පනත**

♦ ඉරුදිනත් ණය මංගල්‍යය දිනවලත් නිවාඩු වලංගු කරව. ඉරුදිනවල හා ණය මංගල්‍යය දිනවල ශුද්ධවන්තව ගත කිරීම හා විවේකීව ගත කිරීමට මෙම පණතින් නියම වේ. මෙම පණත කඩ කිරීම මරණීය පාපයකි.

## දහම් ගුරු ප්‍රථම විභාගය - 2019

## II පත්‍රය

## ප්‍රශ්න හා පිළිතුරු

---

**පළමුවන ප්‍රශ්නයට හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න**

I. i. ධර්මෝපදේශය පිළිබඳ අනුශාසනා පත්‍රයේ (කතකේසි ත්‍රාදෙන්දේ) ඉගැන්වීම් **දෙකක්** ලියන්න.

- ♦ ධර්මෝපදේශය ක්‍රමික විය යුතු ය.
- ♦ ධර්මසාරය මිස අනවශ්‍යය ප්‍රශ්න එහි අඩංගු වීම යෝග්‍ය නොවේ.
- ♦ ධර්මෝපදේශය එල්ල වන්නේ දේව ධර්ම ශාස්ත්‍රීය නිරීක්ෂණය වෙත නොව ඇදහිල්ලේ ජීවිතය වෙත ය.
- ♦ සෑම ආගම පාඩමකට ම පූර්ණ භාවයක් තිබිය යුතු ය.
- ♦ ධර්මෝපදේශයේ හරය ජීවමාන ක්‍රිස්තුන් වහන්සේ ය.
- ♦ ධර්මෝපදේශය බාල, තරුණ, වැඩිහිටි සැමට අවශ්‍යය ය.

ii. ප්‍රාථමික අංශයේ කතෝලික පෙළ පොත්වල ඇති විශේෂ ලක්ෂණ **දෙකක්** ලියන්න.

- ♦ පාඩම් සරල ව ඉදිරිපත් කිරීම
- ♦ ස්වභාවධර්මය තුළින් දේව ආදරය අත්දැකීමට සැලැස්වීම
- ♦ ක්‍රිස්තියානි ප්‍රතිපත්ති අගය කිරීම
- ♦ ධර්මයේ මූලික සත්‍යතා පැහැදිලි ව ඉදිරිපත් කිරීම
- ♦ ජේසුස් වහන්සේගේ විශිෂ්ට ගුණාංග හඳුනා ගැනීම

iii. ගුරු පෞරුෂය යනු කුමක් ද?

- ♦ තමන්ගෙන් ඉගෙන ගන්නා සිසුන්ගේ මනස තුළ ගුරුවරයා පිළිබඳ ගොඩනැගෙන මනෝ රූපය නැතහොත් ආකල්පය ගුරු පෞරුෂය ලෙස හැඳින්වේ.

(

iv දහම් ගුරුවරයාගේ කාර්යය දිවැසි කාර්යයක් යයි හඳුන්වන්නේ ඇයි? හේතු **දෙකක්** ලියන්න.

- ♦ දහම් ගුරුවරයා ප්‍රසාද ස්නාපනය තුළින් දිවැසි කාර්යයකට කැඳවීම ලබයි.
- ♦ එම කැඳවීම අභිවෘද්ධි ආලේපයෙන් වැඩි වර්ධනය වේ.
- ♦ ජේසුස් වහන්සේගේ ජීවිතය හා ඉගැන්වීම් අන් අයට එළිදරව් කිරීමත් සිසු දරුවන් හා දෙවිඳුන් අතර අන්‍යෝන්‍ය සබඳතාවයක් ඇති කිරීම දිවැසිවර කාර්යයකි.

v. පළමුවන වතිකාන මන්ත්‍රණ සභාව පැවැත්වූයේ කිනම් කාල සීමාවක ද?

- ♦ 1869 - 1870 දක්වා කාලයේ දී

vi. දෙවන වතිකාන මන්ත්‍රණ සභාව නිකුත් කළ ප්‍රකාශන දෙකක නම් ලියන්න.

- ♦ ක්‍රිස්තියානි අධ්‍යාපනය පිළිබඳ ප්‍රකාශනය
- ♦ සභාව හා අන්‍ය ආගම් පිළිබඳ ප්‍රකාශනය
- ♦ ආගමික නිදහස පිළිබඳ ප්‍රකාශනය

vii. ගැලවීමේ ඉතිහාසය තුළ නායකත්වය ගත් ආදිපියවරුන් **දෙදෙනකුගේ** නම් ලියන්න.

♦ ආබ්‍රහම් ♦ ඊසාක් ♦ ජාකොබ්

viii. කිතුනු නායකත්වය රැඳී පවතින්නේ කුමක් මත ද?

♦ අපෝස්තලිකත්වය මත ය

ix. ''මාගේ බැටළුවන් පෝෂණය කරන්න. මාගේ බැටළුවන්ගේ එඬේරා වන්න''. මෙ වදන් පැවසුවේ කවුරුන් විසින් කා හට ද?

♦ ජේසුස් වහන්සේ විසින් පේදුරු තුමාට

x. ''දැහැමිකමින් යුතු නිදොස් මිනිසාගේ ජීවිත ගමන පහසු වේ'' මෙය සඳහන් වන්නේ බයිබලයේ කුමන ග්‍රන්ථයේ ද?

♦ හිතෝපදේශය පොත

xi. අපෝස්තුළුවරුන් විසින් ජනපදවලට පත්කළ ප්‍රධාන පිරිස් වර්ග **දෙක** නම් කරන්න.

♦ වැඩිහිටියෝ (ප්‍රෙස්බිටරෝයි) ♦ ප්‍රධානීන් (එපිස්කොපෙයි)

xii. ජෙරුසලෙම් මන්ත්‍රණ සභාවේ දී අන්‍ය ජාතියකයනට නිතුක් කළ නියෝග **දෙකක්** ලියන්න.

♦ අන්‍ය දෙවිවරුන්ට පුදන ලද පිදේනි අනුභවයෙන් වැළකීම
♦ කාමමිථ්‍යාචාරයෙන් වැළකීම
♦ බොටුව මිරිකා මැරූ සතුන් අනුභවයෙන් වැළැකීම

xiii. වධකයන්ගේ ආයුධ මොටවූයේ යැයි ඉතිහාසයේ සඳහන් වන්නේ කුමන අධිරාජ්‍යයාගේ සමයේ ද?

♦ දියොක්ලේසියානු අධිරාජ්‍යාගේ

xiv. ශ්‍රී කුරුසිය ගෞරවාභිමානයට පත්වූයේ කිනම් ආඥාව තුළ ද?

♦ මිලාන් ආඥාව තුළ

xv. ක්‍රි. ව. 373 දී ආලක්සැන්ඩ්‍රියාවේ ස්වර්ගස්ථ වූ සභා පියතුමා කවුද?

♦ ශු. අතනාසියුස් තුමා

xvi. 'ස්වර්ණ මුඛය'යන පටබැඳී නාමයෙන් හඳුන්වනු ලැබුයේ කවුරුන් ද?

♦ ශු. ජෝන් ක්‍රිසොස්තම් තුමා

xvii. කැල්සිඩොන්හි පවත්වන ලද සතරවන ජගත් මන්ත්‍රණ සභාව කැඳවන ලද්දේ කිනම් අධිරාජ්‍යයාගේ සමයේ ද?

♦ මාෂියන් අධරාජ්‍යයා

xviii. නිසියානු විශ්වාස ලක්ෂණයට ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ පිළිබඳව එකතුකරන ලද වගන්තිය කුමක් ද?

- ජනිත වූ නමුත් මවනු නොලැබූ පියාණන් සමඟ එකම භවත්වය ඇතිව උන්වහන්සේ වැඩ සිටින සේක.

xix. බටහිර ප්‍රදේශයේ පළමුවන තාපසරාමය ආරම්භ කළේ කුමන ප්‍රදේශයේ ද? කවුරුන් විසින් ද?

- ප්‍රංශයේ මුවර්ස්හි මර්තීනු තුමන්

xx. තපස් ජීවිතය ප්‍රධාන වශයෙන් බෙදා ඇති කොටස් **දෙක** නම් කරන්න.

- අපරදිග තපස් ජීවිතය - පෙරදිග තපස් ජීවිතය

2. i මනා ගුරු පෞරුෂයක් ඇති ධර්මෝපදේශකයෙකු සතු ගුණාංග **පහක්** ලියන්න.

- දහම් ගුරුවරයා දරුවන්ගේ ගුරුන් මෙන් ම දෙගුරුන් ලෙස ද ක්‍රියා කරන බවට ජීවිත සාක්ෂිය තුළින් පිළිඹිබු කිරීම.
- ධර්මෝපදේශය ඉගැන්වීම දේව කැඳවීමක් බැවින් තමා උගන්වන දේ ගැන හොඳ අවබෝධයක් තිබීම.
- ධර්මෝපදේශය ශුද්ධාත්මයාණන්ගේ කාර්යයකි. එබැවින් දහම් ගුරුවරයා තුළ දැඩි උද්යෝගයක් හා ක්‍රියාශීලි බවක් තිබීම.
- නීතියට, දඬුවමට, ණය යුක්තියකට වඩා හදවත තුළ දැඩි උද්යෝගයක් හා ක්‍රියාශීලි ඉගැන්වීමක් තිබීම.
- ගැඹුරු දේව විශ්වාසය, පරිත්‍යාගය, කැප වූ ජීවිතය.

ii ධර්මෝපදේශ ශාස්ත්‍රයේ ප්‍රධාන සාධක **සතර** විස්තර කරන්න.

- **ගුරුවරයා** - දිවැසි කාර්යයක් සඳහා කැඳවනු ලැබුවෙකි. දෙවිඳුන් හා දරුවන් අතර අනෙයොන්‍ය සබඳතාවයක් ඇති කරන්නෙකි. ගුරුවරයා ක්‍රිස්තුන් වහන්සේගේ හස්තයේ උපකරණයකි. ඔහු දේව වචනය ප්‍රකාශ කළ යුතු ය. ආදර්ශමත් විය යුතු ය.

- **ශිෂ්‍යයා** - දහම් අධ්‍යයනය තුළ ශිෂ්‍යයා වැදගත් ම සාධකයකි. එයට හේතුව අද අධ්‍යයනය මෙහෙයවන්නේ ශිෂ්‍යයා කේන්ද්‍රව ය. සිසුවාව ගුරුවරයා නිවැරදි ලෙස තේරුම්ගත යුතුව ඇත. ඔහුගේ ශාරීරික, මානසික, කායික ක්‍රියාකාරීත්වය තේරුම් ගැනීම.

- **විෂය** - එක් එක් වයසට, ශ්‍රේණියට නියමිත විෂය කරුණු, පෙළපොත් වැදගත් වේ.

- **උගන්වන ක්‍රම වේදය** - එක් එක් වයස් කාණ්ඩවලට සුදුසු ධර්මෝපදේශ ක්‍රමවේද භාවිතය. ප්‍රාථමික හා පශ්චාත් ප්‍රාථමික පන්තිවලට සුදුසු ඉගැන්වීමේ ක්‍රමවේද. නියමික විෂය කරුණු තෝරා නිරවුල් ව පැහැදිලි ව තේරුම් කර දීම. දරුවන්ව හැඩගැස්වීම.

3. i ශු. පාවුලු තුමාගේ නායකත්වයෙන් ඔබට ගතහැකි ආදර්ශයන් **පහක්** ලියන්න.

- ♦ ගැඹුරු දේව විශ්වාසය
- ♦ ක්‍රිස්තු පණිවිඩයේ සාක්ෂිකරුවෙක් වීම
- ♦ පරිත්‍යාගශීලි වීම
- ♦ දෙවි පියාණන්ට කිකරු වීම
- ♦ නායකත්වය, කැපවීම
- ♦ දුක්වේදනා සතුටින් දරා ගැනීම
- ♦ අන් අයව පිළිගැනීම

ii ඔබ මීසම තුළ සැබෑ නායකයෙකු ලෙස ඔබ ක්‍රියාකරන අයුරු පැහැදිලි කරන්න. (වචන 100 කින් පමණ)

- ♦ නායක්තවයට අභිවෘද්ධි ආලේපය තුළින් විශාල වගකීමක් පැවරී ඇත.
- ♦ විශේෂයෙන් දහම් ගුරු කැඳවීම තුළ, මීසම තුළ ක්‍රියා කිරීම
- ♦ ආගමික සමිති තුළ ක්‍රියාකාරී වීම
- ♦ පොදු ජනවන්දනාව තුළ ක්‍රියාකාරී වීම
- ♦ ප්‍රජා සේවාවන් තුළ ක්‍රියාකාරී වීම
- ♦ සේවකත්වයේ සේවාවන්
- ♦ ක්‍රිස්තුන් වහන්සේගේ ගැලවීමේ කාර්යයට සම්බන්ධ වීම.
- ♦ කාලයේ සලකුණුවලට විවෘත වීම
- ♦ ලොව තුළ ලවණක් හා ආලෝකයක් වීම

4. i දෙවන වතිකාන කතිකාවට පෙර සභාවේ තිබූ තත්ත්වය කරුණු **පහකින්** දක්වන්න.

♦ දෙවන වතිකාන කතිකාවට පෙර සභාව ආයතනික ස්වරූපයක් ගොඩනගා තිබුණි. සභාව තුළ පුළුල් බලතල හා වගකීම් පැවිදිවරුනට තිබිණි. ගිහියාට සභාව තුළ තිබුණේ පහත් තත්ත්වයකි. ගිහියා නරඹන්නෙක් පමණක් විය. මේ නිසා ගිහි ක්‍රියාකාරීත්වය අඩපණව තිබිණි. පොදු ජනවන්දනාව ජනතාවට සමීප නොවීම. විවිධ ආගමික ජාතීන් අතර සුහදතාවය හොඳ මට්ටමක නොතිබීම. විවිධ කිතුනු සභා අතර ඇති දුරස්ථභාවය. ජනතාව පොදු ජනවන්දනාවෙන් ඉවත් වී විවිධ භක්ති අභ්‍යාස කරා යොමු වීම. ධර්මෝපදේශ සේවාව අඩාල වීම. සභාව තුළ ශුද්ධවන්තභාවය ලබාගත හැක්කේ පූජක පැවිදි අයට පමණක් යන අදහස පෙරදැරි වීම.

ii ''දෙවන වතිකාන කතිකාව සභාව තුළ පැවැත්වූ වැදගත් ම ජගත් මන්ත්‍රණ සභාව ය'' මෙම මාතෘකාව පිළිබඳ දහම් සඟරාවකට ලිපියක් සකස් කරන්න. (වචන 100 ක් පමණ)

♦ දිර්ඝ සූදානමකින් පැවැත්වීම. දිර්ඝ කාලයක් පැවැත්වීම. (වසර 4ක්) මුලු ලොව ම නියෝජනය කරමින් රදගුරුවරුන් 2500කට අධික පිරිසක් සහභාගී වීම. සභාවේ විවිධ පැතිකඩවල් අළලා ප්‍රකාශන 16 ක් නිකුත් කිරීම. සාමූහිකත්වයේ අදහස් මත තීරණ ගැනීම. දෙවන වතිකාන කතිකාව මඟින් සභාවේ එඬේරික කාර්යය නූතන මිනිසාගේ මනෝභාවයට ගැලපෙන පරිදි දෙව් දහම තුළින් ඉදිරිපත් කිරීම. තත්කාලීන අවශ්‍යතා හඳුනාගෙන නව අපෝස්තලික සේවාවන් පිළිබඳ අවධානය යොමු කිරීම. සභාවේ අර්බුදයන් සමාලෝචනය කිරීම. විවිධ ක්‍රිස්තියානි සභාවල ද අදහස් ලබා ගැනීම. උගත් දේව ධර්ම ශාස්ත්‍රවන්තයන්ගේ අදහස් විමසා කෙටුම්පත් සකස් කිරීම. සභාවට පමණක් නොව මුළු ලෝකයට ම පොදු කරුණු සාකච්ඡා කිරීම.

5. i දහම් ගුරුවරයා විසින් දරුවන් තුළ ගොඩනැගිය යුතු වගකීම් **පහක්** ලියන්න.

- ♦ විධිමත් අධ්‍යාපනයට යොමු කිරීම
- ♦ සාරධර්ම අධ්‍යයනයට යොමු කිරීම.
- ♦ පූර්ණ ක්‍රිස්තියානි ජීවිතයක් වෙත යොමු කිරීම
- ♦ දරුවන් ව ක්‍රිස්තුන් වහන්සේ වෙත යොමු කිරීම
- ♦ පොදු ජන සමාජය යහපත් කිරීමේ වගකීම
- ♦ ලෝකය ශුද්ධවන්ත කිරීමේ කාර්යයට යොමු වීම

ii 'සාරධර්ම අධ්‍යාපනයේ වැදගත්කම අද සමාජය තුළ බෙහෙවින් අවශ්‍ය වී ඇත' (මෙම මාතෘකාව වචන 100 කින් පමණ පැහැදිලි කරන්න.)

♦ සාරධර්ම නිසා ධර්මානුකූල ව දිවි ගෙවීමට හැකි වේ. මිනිසා තුළ ඇතිවන අයහපත් බලවේගවලින් මිදීමේ හැකියාව ලැබේ. සිසුන් තුළ යහපත් සාරධර්ම ගොඩනැගීමට සාරධර්ම අධ්‍යාපනය අවශ්‍ය වේ. සාරධර්ම අධ්‍යාපනය පිරිහීම නිසා අද විවිධ ගැටලු ඇති වී ඇත. කිතුනු ප්‍රේමය තුළ ජීවත් වීමට සාරධර්ම බෙහෙවින් අවශ්‍ය වේ. ශිල ධාර්මික පැවැත්මකට සාරධර්ම අධ්‍යාපනය බෙහෙවින් අවශ්‍ය වේ. සෑම පාසලක ම සාරධර්ම අධ්‍යාපනයට කාලයක් වෙන් කළ යුතු ය. සාරධර්ම අධ්‍යාපනය සෑම පාසලක ම අනිවාර්යය කළ යුතු ය.

6. i ජගත් මන්ත්‍රණ සභාවක් යනු කුමක් ද?

♦ පාප්තුමා සමඟ ලෝක රදගුරුතුමන්ලා සභාවේ උන්නතියට හා සභා ජීවිතයට එල්ල වන අවදානම් සහිත ප්‍රශ්නවල දී ධර්මය හෝ විනය පිළිබඳ නිල වශයෙන් නිවේදන හෝ ප්‍රකාශන නිකුත් කිරීමට එකමුතු වන්නාවූ සභාව ජගත් මන්ත්‍රණ සභාවක් යනුවෙන් හැඳින් වේ.

ii එපීසියේ පවත්වන ලද තෙවන ජගත් මන්ත්‍රණ සභාව තුළින් මරිය තුමිය පිළිබඳ දූරු මතය පැහැදිලි කරන්න.

- ♦ නෙස්ටෝරියස්ගේ වැරදි ඉගැන්වීම් ප්‍රතික්ෂේප කර මරිය තුමිය දේව මාතාවන් වන බව ප්‍රකාශ කළේ ය. කොන්ස්තන්තිනෝපල් රදගුරු තැන්පත් නෙස්ටෝරියස් කියා සිටියේ මරිය තුමිය ක්‍රිස්තුන් වහන්සේගේ මෑණියන් වන නමුත් දෙවියන් වහන්සේගේ මෑණියන් නොවන බව ය.

7. i තාපස ජීවිතය යනු කුමක්දැයි පැහැදිලි කරන්න.

- ♦ ලෝකයෙන් ඈත් වී යාච්ඤාවෙන් හා භාවනාවෙන් ද දූඩි මර්දන ක්‍රියාවල යෙදෙමින් ද තනි හෝ කණ්ඩායමක් වශයෙන් ගත කරන ජීවිතයකි.

ii තපස් පන්ති තුළින් සිදුවන ප්‍රධාන සේවාවන් **පහක්** පැහැදිලි කරන්න.

- ♦ අධ්‍යාපන සේවාව
- ♦ ප්‍රජා සේවාව
- ♦ ළමා හා තරුණ වැඩසටහන්
- ♦ උපදේශන සේවාවන්
- ♦ පවුල් සේවාවන්
- ♦ ස්වයං රැකියා බිහි කිරීම
- ♦ සුව දානයේ සේවාව
- ♦ අනාථ නිවාස පවත්වාගෙන යාම
- ♦ දේව වචනය දේශනා කිරීම
- ♦ නීති ආධාර වැඩසටහන්
- ♦ ආගමික පොත පත ග්‍රන්ථාරූඪ කිරීම

8. පහත සඳහන් මාතෘකාවලින් **තුනක්** තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.

## i. ඔරිජන් තුමා

ක්‍රි.ව 185 - 254 කාලයේ ජීවත් වූවෙකි. ඇලෙක්සැන්ඩ්‍රියාවේ දහම් පීඨයේ නායකයට සිට පසුව පසුව සෙසරියාවේ දහම් පියයේ ද නායකයා වීම. ශු. බයිබලයේ අනුවාද හයක් එකට සකස් කළේ ය. විවිධ කිතුනු පොත් පත් ලියන ලදි. ගිහියෙකු වශයෙන් විවිධ දේශනාවල නිරත විය. ඩෙසියස් අග රජුගේ පීඩනයේ දී බොහෝ පීඩා වින්ද අයෙකි.

## ii. මිලාන් ආඥාව

කොන්ස්තන්තීනු අගරජ ක්‍රි.ව 313 දී මිලාන් ආඥාව නිකුත් කරන ලදි. මෙම ආඥාව මඟින් ක්‍රිස්තු භක්තිකයන්ට නිදහස ලැබිණි. මෙම ආඥාව මඟින් කිතුනුවන්ට

- නීරෝගේ පටන් ශතවර්ෂ 3ක් පැවැති තහනම් නියෝග ඉවත් කරන ලදි.
- කිතු දහම නිදහසේ ඇදහීමට ඉඩ සැලසීම
- අධිරාජ්‍යය පුරා දහම පැතිරවීමට ධර්මදූතයන් යැවීමේ නිදහස ලැබීම
- ශ්‍රී කුරුසිය ගෞරවාභිමානයට පත්වීම
- දේවස්ථාන ඉඳි කිරීමට නිදහස ලැබීම
- අගරදගුරුන් ලතරානු මාලිගය පාප්වහන්සේට පැවරීම

## iii. ජෝශප්ගේ කැඳවීම

දෙවිපියාණෝ ජෝශප් ව කැඳවනු ලැබුනේ ස්වප්නයක් මඟින් ය. ඔහු තම සහෝදරයන්ට පවසන්නේ තමා දුටු සිහිනයකි. ඉර, හද, තාරකා එකොළහක් මට නැමී ආචාර කලේ ය. ජොශප්ව මිසර දේශයේ අධිපතියා වීමට විශේෂ කැඳවීමක් ලත් අයෙකි. (උත්පත්ති 39/9)

## iv. ධර්මෝපදේශයේ විෂය කරුණු

ධර්මෝපදේශ ශාස්ත්‍රයේ දී විෂය කරුණු ඉතා වැදගත් ය. වයස් මට්ටම් අනුව විෂය කරුණු වෙනස් වේ. ඉගැන්වීමේ ක්‍රම ද වෙනස් වේ. මේ සඳහා එක් එක් ශ්‍රේණි සඳහා නියමිත පොත් ඉදිරිපත් කර ඇත. විෂය කරුණු නිවැරදිව වටහා ගෙන සූදානම් වී පාඩම ඉදිරිපත් කළ යුතු ය. ශු. බයිබලය, පෙල පොත් හා එම විෂයට බැඳුනු විවිධ ග්‍රන්ථවලින් විෂය කරුණු ගත හැක.

## v. 23 වන ජුවාම් පාප්තුමා

1958 - 1963 දක්වා කාලය තුළ ශුද්ධොත්තම පාප්ධූරයට පත්විය. දෙවෙනි වතිකාන කතිකාව 1962 දී පැවැත්වූයේ මෙතුමාගේ නායකත්වය යටතේ ය. ජනතාවාදි පාප්තුමකි. ප්‍රගතිශීලි පාප්තුමෙකි. අයුක්තියට පිළිතුර, ලෝක සාමය විශ්ව ලේඛනයන් ලියුවේ මෙතුමා ය. මෙතුමා ව අද සාන්තුවරභාවයට ඔසවා ඇත.

oooooooooooooo